# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,222 - 2021 අප්‍රේල් මස 01 වැනි බ්‍රහස්පතින්දා - 2021.04.01**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV(ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| තනතුරු- ඇබෑර්තු .... ... ... | 538 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | — |
| බඩුබාහිරාදිය විකිණීම් ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... | — |
| අතුරු ව්‍යවස්ථා ... ... ... | — |
| පළාත් පාලන සහ ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම් .. | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... | — |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | — |


*සැ. යු.*-(i) හදට හද භාරකාර අරමුදල (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත, 2021 මාර්තු මස 12 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(ii) බලපිටිය ශ්‍රී රාහුලාරාම පුරාණ විහාරස්ථ සාමණේර ආකල්ප සංවර්ධන භික්ෂු විද්‍යාලය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත, 2021 මාර්තු මස 12 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2021 අප්‍රේල් මස 23 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2021 අප්‍රේල් මස 09 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2021 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* *www. documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# තනතුරු - ඇබෑර්තු

## වලල්ලාවිට ප්‍රාදේශීය සභාව

### බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු පිරවීම

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ වලල්ලාවිට ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරට බඳවා ගැනීම සඳහා මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති බස්නාහිර පළාතේ අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *පුරප්පාඩු සංඛ්‍යාව* | *වැටුප් ක්‍රමය* | *අධ්‍යාපන සුදුසුකම්* |
|---|---|---|---|---|
| 01 | පෙර පාසල් ගුරු **III** | 01 | MN 1-2016<br><br>රු. 27,140 - 10 x 300 -11 x 350 - 10 x 495 - 10 x 660 - රු. 45,540 | *(අ)* සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව/ගණිතය හා තවත් විෂයන් දෙකකට සම්මාන සාමාර්ථ සහිතව එකවර විෂයන් 06කින් අ. පො. ස. සා.පෙළ විභාගය සමත් වී තිබීම.<br><br>*(ආ)* අ.පො.ස. උසස් පෙළ විභාගයේ දී අවම වශයෙන් එක් විෂයක්වත් සමත් වී තිබීම (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර). |

02. *කායික සුදුසුකම් .-* තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

03. *අවශ්‍ය අනෙකුත් සුදුසුකම් :*

- (i) ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතුය.
- (ii) අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර 03 ක් අඛණ්ඩව බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය.
- (iii) පෙර පාසල් ගුරුවරුන් පුහුණු කිරීමේ රජයේ ආයතනයක් මගින් හෝ රජය පිළිගත් (ලියාපදිංචි කරන ලද) පෙර පාසැල් ගුරු පුහුණු ආයතනයක් මගින් ළදරු අධ්‍යාපන හා ළමා සංවර්ධනය පිළිබඳ මාස 06කට නොඅඩු කාලයක පාඨමාලාවක් හදරා සහතිකයක් ලබා තිබිය යුතුය.
- (iv) යහපත් චරිතයකින් යුක්ත හා මනා ශරීර සෞඛ්‍ය තත්වයෙන් යුක්ත විය යුතුය.
- (v) දණ්ඩ නීති සංග්‍රහ යටතේ උසාවියකින් දඬුවම් ලැබූවෙකු නොවිය යුතුය.
- (vi) තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලු සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/*ගැසට් පත්‍රයේ* සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබීම.

04. *වයස .-* අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා 45ට නොවැඩි විය යුතුය.

05. *බඳවා ගැනීමේ ක්‍රමය :* ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් පවත්වා වැඩිම ලකුණු ලබා ගත් අනුපිළිවෙළ මත බඳවා ගැනීම සිදු කෙරේ.

06. *අයදුම්පත් ඉදිරිපත් කිරීම :*

- (i) අයදුම්කරුවන් මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත අනුව පිළියෙල කර ගන්නා ලද අයදුම්පත 2021.04.23 වැනි දින හෝ එදිනට පෙර "ලේකම්, වලල්ලාවිට ප්‍රාදේශීය සභාව, මීගහතැන්න" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.
- (ii) අයදුම්පත බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ අදාළ තනතුර සඳහන් කළ යුතුය.
- (iii) අයදුම්පත සමග පහත සඳහන් සහතිකවල පිටපත් අමුණා එවිය යුතුය.

(අ) උප්පැන්න සහතිකය
(ආ) අධ්‍යාපන සහතික
(ඇ) පාසලෙන් අස්වීමේ සහතිකය
(ඈ) පදිංචිය සහතික කිරීම සඳහා ග්‍රාම නිලධාරි සහතිකය (ප්‍රාදේශීය ලේකම් සහතික කර තිබිය යුතුය.)
(ඉ) මෑතකදී ලබා ගත් චරිත සහතික 02ක්

මෙම අයදුම්පත් කැඳවීමෙන් පසුව හෝ කැඳවන අතරතුර දී හෝ බඳවා ගැනීම හෝ මෙම බඳවා ගැනීම් ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීමේ පූර්ණ බලතල වලල්ලාවිට ප්‍රාදේශීය සභාවේ ලේකම් සතුය.

ඩබ්ලිව්. පාලිත සිසිර කුමාර,
ලේකම්,
වලල්ලාවිට ප්‍රාදේශීය සභාව.
මීගහතැන්න.

2021 අප්‍රේල් මස 01 වැනි දින.

**ආදර්ශ අයදුම්පත්‍රය**

*වලල්ලාවිට ප්‍රාදේශීය සභාව*

**වලල්ලාවිට ප්‍රාදේශීය සභාවේ ........................................ තනතුර සඳහා අයදුම්පත්‍රය**

01. අයදුම්කරුගේ නම මුලකුරු සමග :.......................................................
02. මුලකුරුවලින් හැඳින්වෙන නම :.......................................................
03. ස්ථිර ලිපිනය :.......................................................
04. ග්‍රාම නිලධාරි කොට්ඨාසය :.......................................................
05. දිස්ත්‍රික්කය :.......................................................
06. උපන් දිනය අවුරුද්ද:............... මාසය:............... දිනය:...............
07. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස ෑ අවු.:............... මාස:............... දින:...............
08. ස්ත්‍රී/පුරුෂ භාවය :...........................
09. විවාහක/අවිවාහක යන වග :...........................
10. ශ්‍රී ලංකා පුරවැසියෙක් ද? එසේ නම් පරම්පරාවෙන් ද ලියාපදිංචි වීමෙන් ද යන වග:...........................
11. ජාතික හැඳුනුම්පත් අංකය :...........................
12. දුරකථන අංකය :...........................
13. අධ්‍යාපන සුදුසුකම් :...........................

මෙම අයදුම්පත්‍රයෙහි මා විසින් සපයා ඇති තොරතුරු මාගේ දැනීම හා විශ්වාසය පරිදි නිවැරදි බවට ප්‍රකාශ කරමි. මෙම බඳවා ගැනීමේ කොන්දේසි අනුව මා විසින් සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කර ඇති බව බඳවා ගැනීමට පෙර හෝ පසුව අනාවරණය වුවහොත් කිසිඳු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බව ද දනිමි.

...........................
අයදුම්කරුගේ අත්සන.

දිනය :.....................

04-332

# පළාත් පාලන නිවේදන

සංශෝධනයයි

## වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව

2021 ජනවාරි මස 08 වැනි දින පළ කරන ලද අංක 2210 දරන *ගැසට් පත්‍රයේ* 01-484 යන නිවේදනය පහත සඳහන් පරිදි සංශෝධනය විය යුතු බව දැන්වීමයි.

වෙන්නප්පුව හා දංකොටුව දියුණු කළ ගම් ප්‍රදේශ හෙවත් වරිපනම් බල ප්‍රදේශ, පොදු වෙළඳපළ ප්‍රදේශ වශයෙන් ප්‍රකාශයට පත් කිරීමේ අතුරු ව්‍යවස්ථාව

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 122 හා 126 වැනි වගන්තිවලින් පැවරී ඇති බලතල අනුව හා එහි අංක 120 හා 121 ඡේදවලින් පැවරී ඇති බලතල ප්‍රකාර ඊට අදාළ 1987.08.23 වැනි දින අංක 520/7 දරන *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළාත් පාලන නිවාස ඉදිකිරීම් ගරු අමාත්‍යවරයා විසින් අනුමත කොට ප්‍රකාශයට පත් කර ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවේ අංක 33 වැනි කොටසේ පොදු වෙළඳ පොළවල් පිළිබඳ අතුරු ව්‍යවස්ථාවේ විධිවිධානයන්ට අනුව, 2021 ජනවාරි 01 දින සිට බලාත්මකවන පරිදි, වෙන්නප්පුව නගරයේ දියුණු කළ ගම් ප්‍රදේශය ලෙස නම්කර ඇති (වරිපනම්) ප්‍රදේශය වෙන්නප්පුව පොදු වෙළඳපල ප්‍රදේශය ලෙසත්, දංකොටුව නගරයේ දියුණු කළ ගම් ප්‍රදේශය ලෙස නම්කර ඇති (වරිපනම්) ප්‍රදේශය, දංකොටුව පොදු වෙළඳපළ ප්‍රදේශය ලෙසත්, වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවේ 2020.12.10 වැනි දින පැවති 15 වන මහා සභාවේ දී ගනු ලැබූ අංක 15 දරන තීරණය ප්‍රකාරව, ප්‍රකාශයට පත් කරන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

කේ. වී. සුසන්ත පෙරේරා,
සභාපති,
වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව.

2021 ජනවාරි මස 08 වැනි දින,
වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවේ දී ය.

04-59

---

සංශෝධනයයි

## රඹුක්කන ප්‍රාදේශීය සභාව

2020.12.24 වැනි දන පළ වූ 2,208 *ගැසට් පත්‍රයේ* 12-290/8 නිවේදනය පහත පරිදි සංශෝධනය විය යුතුය.

### 2021 වර්ෂය සඳහා වරිපනම් බදු පැනවීම

රඹුක්කන ප්‍රාදේශීය සභාව විසින් 2020 ඔක්තෝබර් මස 12 වැනි දින පවත්වන ලද මහ සභා රැස්වීමේ දී තීරණ අංක ඉ. i.xi.08 යටතේ පහත දැක්වෙන යෝජනාව සභා සම්මත කරන ලද බව මහජනතාව වෙත මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඊ. එම්. ඒ. එන්. බී. හඳගම,
සභාපති,
රඹුක්කන ප්‍රාදේශීය සභාව.

2020 ක් වූ නොවැම්බර් මස 13 වැනි දින,
රඹුක්කන ප්‍රාදේශීය සභාවේ දී ය.

**යෝජනාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146 වන වගන්තියේ 1 වැනි උපවගන්තියේ ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාරව රඹුක්කන ප්‍රාදේශීය සභාව මගින් දියුණු කළ ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කරන ලද ප්‍රදේශවල පිහිටි සෑම නිශ්චිත දේපළක 2021 වර්ෂයේ වාර්ෂික වටිනාකම සඳහා 2016/2017 වර්ෂ වල සිදු කරන ලද තක්සේරු ප්‍රතිශෝධන මුදල 2021 වර්ෂය සඳහා පිළිගැනීමටත් යථෝක්ත පනතේ 134 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර 1 වැනි උපලේඛනයේ පිහිටි දේපළෙහි වාර්ෂික වටිනාකමින් 6% ක් ද, 2 වැනි උපලේඛනයේ පිහිටි දේපළෙහි වාර්ෂික වටිනාකමින් 5%ක් ද වරිපනම් බද්දක් පනවා අයකළ යුතු බවට යෝජනා කරමි.

2021 වර්ෂය සඳහා පනවන ලද, ඒ වරිපනම් බද්ද මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30 හා දෙසැම්බර් 31 වැනි දිනවලින් අවසානවන සෑම කාර්තුවක් තුළ දී සමාන වාරික හතරකින් ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවිය යුතු බව ද වැඩි දුරටත් නිවේදනය කරනු ලැබේ.

2021 වර්ෂය සඳහාවන සම්පූර්ණ වරිපනම් බද්දක් 2021 වර්ෂයේ ජනවාරි මස 31 වැනි දිනට පෙර ප්‍රාදේශීය සභා කාර්යාලයට ගෙවනු ලැබුවහොත් එම සම්පූර්ණ වරිපනම් ප්‍රමාණයෙන් සියයට දහයක (10%) වට්ටමක් ද, ජනවාරි, අප්‍රේල්, ජූලි, ඔක්තෝබර් මාස වලින් ආරම්භවන එක් එක් කාර්තුවේ ප්‍රථම මාසයෙ අවසන් දිනට පෙර ප්‍රාදේශීය සභාවට ගෙවනු ලබුවහොත් සියයට පහක් (5%) වට්ටමක් ද ගෙවනු ලැබේ.

*කොට්ඨාසය - පාර/මාවත - වරිපනම් අංක*

**කොට්ඨාස අංක 01**

| | |
|---|---|
| කුරුණෑගල පාර වම | 101/24 - 189 |
| හුරීමළුව පාර වම | 03 - 109 |
| හුරීමළුව පාර දකුණ | 04 - 102/52 |
| මැදගොඩැල්ල පාර දකුණ | 06 -10 |
| මොහිදීන් මාවත වම | 01 - 23/ඒ |
| මොහිදන් මාවත දකුණ | 04 - 56/ඒ |

**කොට්ඨාස අංක 02**

| | |
|---|---|
| බෝධිරාජ මාවත වම | 07 - 39 |
| බෝධිරජ මාවත දකුණ | 06 - 48 |
| ධර්මපාල මාවත වම | 01 - 35 |
| ධර්මපාල මාවත දකුණ | 02 - 36 |
| තෝමස් සිල්වා මාවත වම | 03 -3/2/1 |
| තෝමස් සිල්වා මාවත දකුණ | 02 - 14 |
| කරඬුපන පාර දකුණ | 30/30 - 110 |
| කුරුණෑගල පාර වම | 01 - 101/ඒ |
| කුරුණෑගල පාර දකුණ | 80 - 248 |
| සේනානායක මාවත වම | 01 - 53/40 |
| සේනානායක මාවත දකුණ | 02 - 50/2 |
| දුම්රියපල පාර වම | 25 - 25/24 |
| දුම්රියපල පාර දකුණ | 08 - 58/ඒ |

**කොට්ඨාස අංක 03**

| | |
|---|---|
| රෝහල පාර වම | 01 - 35/ඒ |
| කුරුණෑගල පාර දකුණ | 02 - 78/1 |
| කරඬුපන පාර දකුණ | 02 - 32 |
| මාවනැල්ල පාර වම | 01 - 81 |

*කොට්ඨාසය - පාර/මාවත - වරිපනම් අංක*

**කොට්ඨාස අංක 04**

| | |
|---|---|
| මිහිඳු මාවත වම | 05 - 69 |
| මිහිඳු මාවත දකුණ | 02 - 74 |
| රෝහල පාර වම | 33 - 103 |
| රෝහල පාර දකුණ | 72 - 92 |
| ගැමුණු මාවත වම | 01 -35 |
| ගැමුණු මාවත දකුණ | 04 - 60 |
| කුරුණෑගල පාර දකුණ | 244 - 266 |

**කොට්ඨාස අංක 05**

| | |
|---|---|
| රෝහල පාර | 06 - 76 |
| මාවනැල්ල පාර | 85 - 179/40 |
| රාජසිංහ මාවත වම | 07- 35 |

**කොට්ඨාස අංක 06**

| | |
|---|---|
| අශෝක මාවත වම | 01 - 23 |
| බණ්ඩාරනායක මාවත වම | 07 - 29 |
| මාවනැල්ල පාර වම | 185 -257 |
| මාවනැල්ල පාර දකුණ | 100 - 152 |
| කොතලාවල පාර වම | 07- 55 |
| කොතලාවල පාර දකුණ | 08 - 54 |
| රාජසිංහ මවත දකුණ | 08 - 62 |
| දහනායක මාවත වම | 03 - 23 |
| දහනායක මාවත දකුණ | 04 32 |

**කොට්ඨාස අංක 07**

| | |
|---|---|
| කරඬුපන පාර වම | 03 - 153/ඒ |
| කීර්තිරත්න මාවත වම | 05 - 31/4 |
| කීර්තිරත්න මාවත දකුණ | 06 - 76 |
| කන්දහේන පාර වම | 03 - 21/10 |
| කන්දහේන පාර දකුණ | 06 - 36 |
| කළුගල්ල මාවත වම | 03 - 35 |
| කළුගල්ල මාවත දකුණ | 02 -22 |
| මාවනැල්ල පාර දකුණ | 74/1 - 96/11 |
| මහඔය පාර වම | 03 -69 |
| මහඔය පාර දකුණ | 02 - 60 |
| මිලී මාවත වම | 03 - 39 |
| මිලී මාවත දකුණ | 08 - 24 |

උපලේඛනය II

| *කොට්ඨාසය - පාර/මාවත - වරිපනම් අංක* | | *කොට්ඨාසය - පාර/මාවත - වරිපනම් අංක* | |
|---|---|---|---|
| **පින්නවල දියුණු කළ ප්‍රදේශය** | | **පදවිගම්පල දියුණු කළ ප්‍රදේශය** | |
| **කොට්ඨාස අංක 08** | | **කොට්ඨාස අංක 10** | |
| රඹුක්කන පාර වම | 409 - 871/1 | රඹුක්කන පාර වම | 01 - 21 |
| රඹුක්කන පාර දකුණ | 362 - 872/2 | රඹුක්කන පාර දකුණ | 02 - 24 |
| නුවර පාර වම | 41 - 665/ඒ/1 | කුරුණෑගල පාර වම | 07 - 21 |
| නුවර පාර දකුණ | 90 - 1030/1 | කුරුණෑගල පාර දකුණ | 02 - 36 |
| පොල්ගහවෙල පාර වම | 03 - 25 | පොතුහැර පාර වම | 01 - 55/2/1 |
| | | පොතුහැර පාර දකුණ | 02 - 58 |
| | | කහඹිලියාගොඩ පාර වම | 05 - 5/1 |
| **කොට්ඨාස අංක 09** | | **කොට්ඨාස අංක 11** | |
| වාකිරිගල දියුණු කළ ප්‍රදේශය | | **ගම්දොලහ පත්තුව** | |
| රඹුක්කන පාර වම | 05 - 385 | පොල්ගහවෙල පාර වම | 195 -225/ඒ |
| රඹුක්කන පාර දකුණ | 06 - 438/ඒ | පොල්ගහවෙල පාර දකුණ | 144/3 - 224 |

04-92

---

## ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව

### 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වැනි වගන්තිය යටතේ කරනු ලබන නිවේදනයයි

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වැනි වගන්තිය ප්‍රකාරව, සබරගමුව පළාත් සභාවේ රත්නපුර දිස්ත්‍රික්කයේ ඇහැලිය ගොඩ ප්‍රාදේශීය සභාව විසින් මෙහි පහත උපලේඛනයේ දක්වා ඇති මංමාවත් ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව සතු මංමාවත් වශයෙන් ප්‍රකාශයට පත් කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

මේ පිළිබඳව ප්‍රදේශයේ පොදු ජනතාවගේ හෝ මංමාවත් වලට අදාළ ඉඩම් අයිතිකරුවන් ලෙස හිමිකම්පාන පාර්ශවයන්ගේ කිසිදු විරුද්ධත්වයක් මා විසින් ප්‍රසිද්ධ කරනු ලැබූ කාල සීමාවෙහි ඉදිරිපත් වී නොමැති බැවින් උපලේඛනයේ සඳහන් මංමාවත් ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව සතු මංමාවත් වශයෙන් පිළිගෙන පාලනය කරනු ලබන බැව් පොදු ජනතාවගේ දැන ගැනීම සඳහා මෙයින් ප්‍රකාශ කරමි.

තිලක් රෝහණ ජයවික්‍රම,
සභාපති,
ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව.

2021 මාර්තු මස 16 වැනි දින,
ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව.

| | | | |
|---|---|---|---|
| 01. | මාර්ගයේ නම | - | යායපාර ගුණසරණ මාවත |
| | වසම | - | යකුදාගොඩ |
| | මාර්ගයේ දිග | - | මීටර් 425.6 |
| | මාර්ගයේ පළල | - | මීටර් 3.6 |


| පාරේ වම්පස | | පාරේ දකුණු පස | |
|---|---|---|---|
| 01. | එච්. කේ. පුණ්‍යසිරි - චන්ද්‍රා හිටපු වත්ත | 01. | එල්. එච්. රංසා සහ ජයන්ත රත්නසිරි - කුරුනෙ වත්ත |
| 02. | එම්. කේ. අමිල මේනක - චන්ද්‍රා හිටපු වත්ත | 02. | පී. ඩී. සේනාරත්න - කුරුනෙවත්ත |
| 03. | එම්. කේ. මේනක - චන්ද්‍රා හිටපු වත්ත | 03. | වයි. ඩී. සුහසිංහ - ඉඩම |
| 04. | කේ. පී. ඩී. පී. ක්‍රිෂාන්ත - කුඩාදූරගෙවත්ත නොහොත් හේවයාගෙවත්ත | 04. | ඒ. පී. ඩී. එස්. රසුන්ත - පාලම්වත්ත නොහොත් බටුන්ගෙවත්ත |
| 05. | එ. ඩී. ප්‍රේමරත්න - කුඩාදූරගෙවත්ත නොහොත් හේවයාගෙවත්ත | 05. | වයි. ඩී. පියරත්න - පාලම්ගෙවත්ත නොහොත් බටුන්ගෙවත්ත |
| 06. | ජී. ඩී. අබේරත්න - කුඩාදූරගෙවත්ත නොහොත් හේවයාගෙවත්ත | 06. | ඒ. පී. ඩී. උපුල් ශාන්ත - පාලම්වත්ත නොහොත් බටුන්ගෙවත්ත |
| 07. | එල්. එච්. සෝමපාල - ලාවුලුගහවත්ත | 07. | එම්. පී. සුමිත් ජයසිහ - බටුන්ගෙවත්ත |
| 08. | චමින්ද සුරේෂ් - ඉඩම | 08. | එම්. කේ. ගුණරත්න - කුඩාදූරගෙවත්ත නොහොත් කොහිලවත්ත |
| 09. | විකල්ප මාර්ගය - නිවාසවලට | 09. | එම්. කේ. සුනිල් ප්‍රේමරත්න - කොහිලවත්ත |
| 10. | වයි. උක්කු හතනා - ලාවුළුගහවත්ත | 10. | ඒ. ඩී. අජිත් රාමචන්ද්‍ර - මන්නෙගෙදරවත්ත |
| 11. | එම්. කේ. ටී. එස්. සෝමසිරි - මහකුඹුර ගොඩැල්ල | 11. | ඒ. ජී. අජිත් - මන්නෙගෙදරවත්ත |
| 12. | පොදු ළිඳ | 12. | ඒ. ඩී. රන්කිරා - මන්නෙගෙදරවත්ත |
| 13. | ඒ. ඩී. ආර් කේ. පෙරේරා - මන්නෙගෙදරවත්ත | 13. | ඒ. ඩී. ආර්.කේ. පෙරේරා - මන්නෙගෙදරවත්ත |
| 14. | ඒ. ඩී. මාලනී රණසිංහ - මන්නෙගෙදරවත්ත හා දෙපා ඇල | 14. | ඒ. ඩී. මාලනී රණසිංහ - මන්නෙගෙදරවත්ත |
| 15. | ඒ. ඩී. උපාලි රණසිංහ - මන්නෙගෙදරවත්ත හා දෙපා ඇල | 15. | ඒ. ඩී. උපාලි රණසිංහ - මන්නෙගෙදරවත්ත |
| 16. | ඒ. ඩී. රන්කිරා - මන්නෙගෙදරවත්ත | 16. | වයි. ඩී. මුනිදාස - කොහිලගොඩැල්ල |
| 17. | අඩි පාර - කුඹුරට | | |
| 18. | එල්. එච්. මංගල මුණසිංහ - කොහිලගොඩැල්ල | 17. | එල්. එච්. මංගල මුණසිංහ - කොහිලගොඩැල්ල |
| අවසානය - ඒ. පී. ඩී. උපාලි - උඩවරුවෙල ගොඩැල්ල | | | |

02. මාර්ගයේ නම - පනාවල කන්ද උඩ ඉළුක්පිටිය කන්ද මාර්ගය
වසම - ඇහැලියගොඩ වත්ත
මාර්ගයේ දිග - මීටර් 200
මාර්ගයේ පළල - මීටර් 4.5

| මාර්ගයේ වම්පස | | මාර්ගයේ දකුණු පස | |
|---|---|---|---|
| 01. | එම්. ඒ. කරුණාරත්න | 01. | ජනක කරුණාරත්න |
| 02. | දෙළ මාර්ගය | 02. | ප්‍රියන්ත කරුණාසිරි |
| 03. | පන්සල | 03. | එම්. ඩබ්. කරුණාතිලක |
| 04. | ආර්. ඒ. ආරියසේන | 04. | එම්. ඒ. කරුණාරත්න |
| | | 05. | පන්සල |
| | | 06. | රුක්මල්දෙණිය වත්ත |

H.A.K.Chaminda Wijesinghe.(M.S.I.)
Regd.Licensed Surveyor , Leveller,
Court Commissioner & Valuer
No 131/C/4
Dandeniya
Eheliyagoda.
T.P. 071 1202041

PLAN NO 1330




Scale 1:2000

# PLAN

Of an Allotment of Land Called
Panawala Kanda Uda Ilukpitiya Kanda Road
Situated at Wilegoda Village in Palle Pattu of Kuruwiti Korale
(Within Limits of Eheliyagoda Pradeshiya Sabaha , Eheliyagoda D.S.area
& Eheliyagodawatta Grama Niladari Division)
Ratnapura District
Sabaragamuwa Province

Bounded as Follows

North by Road & Rukmaldeniyewatta
East by Rukmaldeniyewatta, Land of Temple , M.A.Karunarathne, M.W.Karunathilake , Priyantha Kumarasiri & Janaka Karunarathne
South by Main Road
West by Land of M.A.Karunarathne , Res : along Dola , Land of Temple ,R.A.Ariyarathne & others & Road

Containing in Extent (0.12393 Hectares)(0 A 1 R 9.00 P)

Surveyed on the 11 th day of February 2020


At the request of : Chairman , Eheliyagoda Pradeshiya Sabahawa
Boundaries Pointed out by : Mr.T.V.N.Ramanayake (Technical Officer)

Regd.Licensed Surveyor
11-02 - 2020

සත්‍ය පිටපතක් බවට සහතික කරමි.


ලේකම්/ප්‍රා.සළමණාකරණ සහකාර
ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව

SISL Membership No. 1842


ගුණසරණ මාවත (මාර්ගය - යෝජිත පුළුල කිරීම)
කොටස් 2 න් 1 වැනි කොටස
පිඹුරු අංකය : 127
ගම : යකුදාගොඩ
ප්‍රාදේශීය සභාව : ඇහැළියගොඩ
කුරුවිටි කෝරළේ
136G, යකුදාගොඩ
ප්‍රා.ලේ. කොට්ඨාශය : ඇහැළියගොඩ
දිස්ත්‍රික්කය : රත්නපුර
පළාත : සබරගමුව
T.P: 071 8201225 &
036 2267490
සංකේත
නිවාසවල සිට මාර්ගය

| | ප්‍රමාණය | | | | මායිම් | | | |
|---|---|---|---|---|---|---|---|---|
| කැබලි අංක | හෙක්ටයාර් | අ. | රූ. | පර්. | උතුරට | නැගෙනහිරට | දකුණට | බටහිරට |
| 1 | 0.00135 | 0 | 0 | 0.53 | යාය පාර | මාර්ගය | 3 වැනි බිම් කැබැල්ල | එල්. එච්. රන්සා සහ ටී.ඒ.ජයන්ත රත්නසිරි හිමිකම් කියන කුරුනෙවත්ත |
| 2 | 0.00107 | 0 | 0 | 0.42 | යාය පාර | එම්. කේ. පුන්‍යසිරි හිමිකම් කියන කුරුනෙ වත්ත | මාර්ගය | මාර්ගය |
| 3 | 0.00020 | 0 | 0 | 0.11 | එල්.එච්. රන්සා සහ පී. ඩී. ජයන්ත රත්නසිරි හිමිකම් කියන කුරුනෙ වත්ත සහ වැනි බිම් කැබැල්ල | මාර්ගය | නිවාසවල සිට මාර්ගය | පී. ඩී. සේනාරත්න හිමිකම් කියන කුරුනෙවත්ත |
| 4 | 0.00031 | 0 | 0 | 0.12 | මාර්ගය | මාර්ගය | වයි. ඩී. පියරත්න හිමිකම් කියන පාලම්වත්ත *නොහොත්* බටුන්ගෙවත්ත | වයි. ඩී. පියරත්න හිමිකම් කියක පාලම්වත්ත *නොහොත්* බටුන්ගෙවත්ත |
| 5 | 0.00003 | 0 | 0 | 0.01 | එම්. කේ. අමිත් ක්‍රිෂාන් හිමිකම් කියන චන්ද්‍රා හිටපුවත්ත | එම්. කේ. අමිල ක්‍රිෂාන් හිමිකම් කියන චන්ද්‍රා හිටපු වත්ත | මාර්ගය | මාර්ගය |
| 6 | 0.00002 | 0 | 0 | 0.01 | ඒ. ඩී. ප්‍රේමරත්න හිමිකම් කියන කුඩාදුරුගෙවත්ත *නොහොත්* හෙවයාගෙවත්ත | ඒ. ඩී. ප්‍රේමරත්න හිමිකම් කියන කුඩාදුරුගෙවත්ත *නොහොත්* හේවයාගෙවත්ත | මාර්ගය | මාර්ගය |
| 7 | 0.00053 | 0 | 0 | 0.27 | මාර්ගය | මාර්ගය | එම්. කේ. ගුණරත්න හිමිකම් කියන කුඩාදුරුගෙවත්ත *නොහොත්* හේවයාගෙවත්ත කොහිලවත්ත | මාර්ගය |
| 8 | 0.00002 | 0 | 0 | 0.01 | ඒ. ඩී. ප්‍රේමරත්න හිමිකම් කියන කුඩාදුරුගෙවත්ත *නොහොත්* හේවයාගෙවත්ත | 9 වැනි බිම් කැබැල්ල | මාර්ගය | මාර්ගය |
| 9 | 0.00003 | 0 | 0 | 0.01 | පී. ඩී. අබේරත්න හිමිකම් කියන කුඩාදුරුගෙවත්ත *නොහොත්* හේවයාගෙවත්ත | මාර්ගය | මාර්ගය | 8 වැනි බිම් කොටස |

| | ප්‍රමාණය | | | | මායිම් | | | |
|---|---|---|---|---|---|---|---|---|
| කැබලි අංක | හෙක්ටයාර් | අ. | රූ. | පර්. | උතුරට | නැගෙනහිරට | දකුණට | බටහිරට |
| 10 | 0.00003 | 0 | 0 | 0.03 | මාර්ගය | එම්. කේ. සුනිල් ප්‍රේමරත්න හිමිකම් කියන කොහිලවත්ත | එම්. කේ. සුනිල් ප්‍රේමරත්න හිමිකම් කියන කොහිලවත්ත | මාර්ගය |
| 11 | 0.00012 | 0 | 0 | 0.05 | මාර්ගය | එම්. කේ. සුනිල් ප්‍රේමරත්න හිමිකම් කියන කොහිලවත්ත | එම්. කේ. සුනිල් ප්‍රේමරත්න හිමිකම් කියන කොහිලවත්ත | මාර්ගය |
| 12 | 0.00012 | 0 | 0 | 0.05 | මාර්ගය | ඒ.ඩී, අජිත් රාමචන්ද්‍ර හිමිකම් කියන මන්නෙගෙදර වත්ත | ඒ. ඩී. අජිත් රාමචන්ද්‍ර හිමිකම් කියන මන්නෙගෙදර වත්ත | මාර්ගය |
| 13 | 0.00001 | 0 | 0 | 0.00 | වයි.උක්කු හතනා හිමිකම් කියන ලාවුළුගහ වත්ත | මාර්ගය | මාර්ගය | මාර්ගය |
| 14 | 0.00005 | 0 | 0 | 0.09 | මාර්ගය | මාර්ගය | ඒ. ඩී. අජිත් වර්තමාන හිමිකම් කියන මන්නෙගෙදර වත්ත | ඒ. ඩී. අජිත් වර්තමාන හිමිකම් කියන මන්නෙගෙදර වත්ත |
| 15 | 0.00205 | 0 | 0 | 0.02 | වයි. උක්කු හතනා හිමිකම් කියන ලාවුළුගහ වත්ත | වයි. උක්කු හතනා හිමිකම් කියන ලාවුළුගහවත්ත | මාර්ගය | මාර්ගය |
| 16 | 0.00004 | 0 | 0 | 0.02 | වයි. උක්කු හතනා හිමිකම් කියන ලාවුළුගහ වත්ත | වයි. උක්කු හතනා හිමිකම් කියන ලාවුළුගහවත්ත | මාර්ගය | මාර්ගය |
| 17 | 0.00006 | 0 | 0 | 0.02 | මාර්ගය සහ වයි. උක්කු හතනා හිමිකම් කියන ලාවුළුගහ වත්ත | වයි. උක්කු හතනා හිමිකම් කියන ලාවුළුගහවත්ත | මාර්ගය | මාර්ගය |
| 18 | 0.00016 | 0 | 0 | 0.06 | මාර්ගය | මාර්ගය | මාර්ගය | ඒ. ඩී. අජිත් වර්තමාන හිමිකම් කියන මන්නෙගෙදර වත්ත |
| 19 | 0.00057 | 0 | 0 | 0.23 | මාර්ගය | මාර්ගය | 20 වැනි බිම් කැබැල්ල | ඒ. ඩී. ආර්. කේ. පෙරේරා හිමිකම් කියන මන්නෙගෙදර වත්ත |
| 20 | 0.00031 | 0 | 0 | 0.12 | 19 වැනි බිම් කැබැල්ල | මාර්ගය | මාර්ගය | ඒ. ඩී. මාලනී රණසිංහ හිමිකම් කියන මන්නෙගෙදර වත්ත |


පිඹුරු අංකය : 127
ගම : යකුදාගොඩ
ප්‍රාදේශීය සභාව : ඇහැළියගොඩ
ග්‍රාම නිලධාරී කොට්ඨාශය: 136G, යකුදාගොඩ
ප්‍රා.ලේ. කොට්ඨාශය : ඇහැළියගොඩ
දිස්ත්‍රික්කය : රත්නපුර
පළාත : සබරගමුව
සත්‍ය පිටපතක් බවට සහතික කරමි.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
## දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන
## සංශෝධිත ගාස්තු

2013 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.)

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය. මුදල් ඇණවුම් ගෙවන කාර්යාලය බොරැල්ල තැපැල් කාර්යාලය වේ.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක් පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළෙඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යැයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රිම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2013 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | *රු.* | *ශ.* |
|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 137 | 0 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... ... | 137 | 0 |
| තනි තීරුවකට හෝ *ගැසට්* පිටුවකින් අඩකට ... ... ... | 1,300 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ *ගැසට්* පිටුවකට ... ... ... | 2,600 | 0 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ *ගැසට් පත්‍රයේ* සෑම කොටසක ම කෙලවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. *ගැසට් පත්‍රය* නොලැබීම, ප්‍රමාද වී ලැබීම සහ ලිපිනය වෙනස් කිරීම් ආදිය කොළඹ 08, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ, මුද්‍රණාලයාධිපතිට දැනුම් දිය යුතු ය.
14. **2013 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)

| | *වාර්ෂික දායක මුදල* *රු. ශ.* | *තැපැල් ගාස්තුව* *රු. ශ.* |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 4,160 0 | 9,340 0 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 580 0 | 950 0 |
| III වැනි ඡේදය (වෙළඳ ලකුණු හා පේටන්ට් බලපත්‍ර ආදිය ) ... ... | 405 0 | 750 0 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව ) ... ... | 890 0 | 2,500 0 |
| II වැනි කොටස (අධිකරණ) ... ... ... ... ... ... ... ... | 860 0 | 450 0 |
| III වැනි කොටස (ඉඩම්) ... ... ... ... ... ... ... ... | 260 0 | 275 0 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... | 2,080 0 | 4,360 0 |
| V වැනි කොටස (මගීන් ගෙන යෑමේ අවසර සහ පොත් නාමාවලිය) | 1,300 0 | 3,640 0 |
| VI වැනි කොටස (ජූරිසභිකයින්ගේ හා උපදේශකවරුන්ගේ නාමාවලිය)... ... | 780 0 | 1,250 0 |
| අති විශෙෂ ගැසට් පත්‍රය ... ... ... ... ... ... ...... | 5,145 0 | 5,520 0 |

(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොලොස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය. )

### * තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | **පිටපතක මිල** *රු. ශ.* | **තැපැල් ගාස්තුව** *රු. ශ.* |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 40 0 | 60 0 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 25 0 | 60 0 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... | 15 0 | 60 0 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 80 0 | 120 0 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 0 | 60 0 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 0 | 60 0 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 23 0 | 60 0 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... | 123 0 | 60 0 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... | 87 0 | 60 0 |

* කොළඹ 05, පොල්හේන්ගොඩ, කිරුළපන මාවතේ, අංක 163 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් තනි පිටපත් මිල දී ගත හැක.

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මඟින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන් ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

**සැළකිය යුතුයි.** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2021 වර්ෂය** | | | |
| **අප්‍රේල්** | 2021.04.01 | බ්‍රහස්පතින්දා | 2021.03.19 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2021.04.09 | සිකුරාදා | 2021.03.26 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2021.04.16 | සිකුරාදා | 2021.04.01 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| | 2021.04.23 | සිකුරාදා | 2021.04.09 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2021.04.30 | සිකුරාදා | 2021.04.16 | සිකුරාදා | දහවල් | 12.00 |
| **මැයි** | 2021.05.07 | සිකුරාදා | 2021.04.23 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2021.05.13 | බ්‍රහස්පතින්දා | 2021.04.30 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2021.05.21 | සිකුරාදා | 2021.05.07 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2021.05.28 | සිකුරාදා | 2021.05.13 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| **ජූනි** | 2021.06.04 | සිකුරාදා | 2021.05.21 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2021.06.11 | සිකුරාදා | 2021.05.28 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2021.06.18 | සිකුරාදා | 2020.06.04 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2021.06.25 | සිකුරාදා | 2020.06.11 | සිකුරාදා | දහවල් | 12.00 |

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2021 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.